
# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# Annual Performance Report

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# 2018




## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2018

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 9, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

**1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, 1970 දි අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන, 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය.**

**මේ වන විට විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් නොනිමි මෙහෙවරක යෙදෙන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, පසුගිය දශක කිහිපයක් වූ සිය ඉතිහාසයේ ක්‍රීඩාව හා බැඳුණු අමාත්‍යාංශ ගණනාවක් යටතේ ක්‍රියාත්මක වී ඇත.**
**එනම්,**

- **1989 - යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය**
- **2000 - සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය**
- **2003 - තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය**
- **2004 - ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**
- **2007 - ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය**
- **2010 - ක්‍රීඩා අමාත්‍යාංශය**
- **2015 - සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය (දින සියයේ වැඩසටහන)**
- **2015 - ක්‍රීඩා අමාත්‍යාංශය**
- **2018 - පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය**
- **2018 - විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය**

**යනාදී වශයෙනි.**

### දැක්ම

**ක්‍රීඩාවේ සංවර්ධනය තුළින් ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත්වීම.**

### මෙහෙවර

**ක්‍රීඩාවේ යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනයට අදාල උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවට නැගීම තුළින් ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමත්, නිරෝගී, විනයගරුක ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහිකිරීමත් මඟින් රටේ සංවර්ධනය ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානවත් ජාතිය බවට පත්කිරිම.**

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

### 01. මානව සම්පත් සංවර්ධනය

- **ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දිම.**
- **ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශීය හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරගවලට යොමුකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.**
- **ක්‍රීඩා පුහුණුකරුවන්ට හා ක්‍රීඩා නිලධාරීන්ට විදේශ පුහුණුව ලබාදීම.**
- **විදේශ පුහුණුකරුවන් හරහා ශ්‍රී ලාංකික පුහුණුකරුවන්ට පුහුණුව ලබාදීම.**
- **ක්‍රීඩා නිලධාරීන්ට නව තාක්ෂණය හඳුන්වාදිම සඳහා වැඩමුළු සංවිධානය කිරිම.**
- **දේශීය හා විදේශීය ක්‍රීඩා විශේෂඥයන් ලවා ක්‍රීඩා නිලධාරීන්ට හා පුහුණුකරුවන්ට ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්විම.**
- **දේශීය හා විදේශීය ක්‍රීඩා අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම.**

## 02. යටිතල පහසුකම් සංවර්ධනය

- ජාත්‍යන්තර තරඟ සඳහා යෝග්‍ය වන ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම.
- ලංකාවේ සෑම පළාතකම ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම.
- ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය.
- ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම.
- පාසල් මට්ටමින් ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම.

# 1. මානව සම්පත් සංවර්ධනය

## 1.1. ජාතික මහා ක්‍රීඩා උළෙල පැවැත්වීම

දිවයිනේ පළාත් මට්ටමින් තෝරාගනු ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික තලයට කැඳවා දක්ෂයින් හඳුනා ගැනීම සහ එම දක්ෂතා ඔප් නැංවීමට අවස්ථාව ලබා ගනිමින් ජාතික මට්ටමේ දී හඳුනාගත් කුසලතා එළි දැක්වීමට අවස්ථාව ලබා දීම මෙම වැඩ සටහනේ අරමුණ වේ. ජාතික මහා ක්‍රීඩා උළෙල ක්‍රීඩා ඉසව් 34 ක් යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් මට්ටම, පළාත් මට්ටම හා අන්තර් පළාත් මට්ටම හෙවත් අවසන් ක්‍රීඩා උළෙල ලෙස අදියර 4 ක් යටතේ ක්‍රියාත්මක වේ.

### 1.1.1. 44 වන ජාතික මහා ක්‍රීඩා උළෙල හා එහි ප්‍රගතිය

2018 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රු.මි 186.00
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය - රු. මි 180.96

### 1.1.2. 44 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී පිහිටුවන ලද ශ්‍රී ලංකා වාර්තා

| අංකය | ක්‍රීඩකයාගේ නම | ක්‍රීඩාව | ඉසව්ව/ බර පංතිය | පළාත | දක්ෂතාවය |
|---|---|---|---|---|---|
| 1 | බී.ඩී.එච්. ගෝමස් | බර ඉසිලීම | කි.ග්‍රෑම් 48 | බස්නාහිර | කි.ග්‍රෑම් 158 |
| 2 | වී. අර්ශිකා | බර ඉසිලීම | කි.ග්‍රෑම් 63 | උතුරු පළාත | කි.ග්‍රෑම් 173 |
| 3 | බී.සී. ප්‍රියන්ති | බර ඉසිලීම | කි.ග්‍රෑම් 90 | දකුණු පළාත | කි.ග්‍රෑම් 170 |
| 4 | එච්.ටී.එම්.පී.ජේ. හපුතැන්න | බර ඉසිලීම | කි.ග්‍රෑම් 90 ට වැඩි | උතුරු මැද පළාත | කි.ග්‍රෑම් 190 |
| 5 | ඩී.කේ.ටී.ඩබ්.කේ. පලහසිංහ | බර ඉසිලීම | කි.ග්‍රෑම් 62 | උතුරු මැද පළාත | කි.ග්‍රෑම් 281 |
| 6 | සී.ජී.එන්. විතානගේ | බර ඉසිලීම | කි.ග්‍රෑම් 85 | උතුරු මැද පළාත | කි.ග්‍රෑම් 300 |




44 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ අවස්ථා

## 1.2. 2018 වර්ෂය තුළ දී ලබා ගත් ජාත්‍යන්තර තරග ජයග්‍රහණ

2018 වර්ෂයේ ජාත්‍යන්තර තරග සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රු.මි. 186.82
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය - රු.මි. 170.78

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ | |
| 01 | වුෂූ | දකුණු ආසියානු වුෂූ තරගාවලිය | පකිස්ථානය | 06 | 01 | 03 | 10 |
| 02 | බර ඉසිලීම | පොදුරාජ්‍ය මණ්ඩලීය මළල ක්‍රීඩා උළෙල | ඕස්ට්‍රේලියාව | - | 01 | 02 | 03 |
| 03 | බොක්ෂිං | | | - | - | 03 | 03 |
| 04 | මීටර 400 (ගෘහස්ථ) | 8 වන ආසියානු ගෘහස්ථ මළල ක්‍රීඩා තරගාවලිය | ඉරානය | 01 | - | 01 | 02 |
| 05 | දුර පැනීම | | | - | - | 01 | 01 |
| 06 | මීටර 800 | | | - | - | 01 | 01 |
| 07 | මීටර 800 | තායිලන්ත විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | තායිලන්තය | 01 | - | - | 01 |
| 08 | දුර පැනීම | | | 01 | - | 01 | 02 |
| 09 | උස පැනීම | | | 01 | - | - | 01 |
| 10 | හෙල්ල විසි කිරීම | | | 01 | - | - | 01 |
| 11 | මීටර 400 | | | 01 | - | - | 01 |
| 12 | මීටර 200 | | | - | 01 | - | 01 |
| 13 | මීටර 400 කඩුලු | | | - | 01 | - | 01 |
| 14 | සත්ප්‍රයාම | | | - | - | 01 | 01 |
| 15 | මීටර 100 කඩුලු | | | - | - | 01 | 01 |
| 16 | මීටර 100 (පිරිමි) | 18 වන ආසියානු ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වූ ආරාධිත තරගාවලිය | ඉන්දුනීසියාව | 01 | - | - | 01 |
| 17 | මීටර 400 (කාන්තා) | | | - | - | 01 | 01 |
| 18 | මීටර 400 (පිරිමි) | | | 01 | - | 01 | 02 |
| 19 | හෙල්ල විසි කිරීම (පිරිමි) | | | - | 01 | - | 01 |
| 20 | හෙල්ල විසි කිරීම (කාන්තා) | | | 01 | - | - | 01 |
| 21 | දුර පැනීම (පිරිමි) | 18 වන ආසියානු ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වූ ආරාධිත තරගාවලිය | ඉන්දුනීසියාව | - | - | 01 | 01 |
| 22 | මීටර 1500 (කාන්තා) | | | - | 01 | - | 01 |
| 23 | මීටර 300 බාධක දිවීම (කාන්තා) | | | 01 | - | - | 01 |
| 24 | දශප්‍රයාම (පිරිමි) | | | - | 01 | - | 01 |
| 25 | තුන් පිම්ම (කාන්තා) | | | - | 01 | 01 | 02 |
| 26 | මීටර 5000 (පිරිමි) | | | - | - | 01 | 01 |
| 27 | මීටර 3000 බාධක දිවීම (පිරිමි) | | | 01 | - | - | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 28 | මීටර 800 (කාන්තා) | 18 වන ආසියානු ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වූ ආරාධිත තරගාවලිය | ඉන්දුනීසියාව | - | 01 | 01 | 02 |
| 29 | මීටර 400 x 4(පිරිමි) | | | - | - | 01 | 01 |
| 30 | මීටර 100 x 4(පිරිමි) | | | - | 01 | - | 01 |
| 31 | මීටර 400 (කාන්තා) | 18 වන ආසියානු කනිෂ්ඨ මළල ක්‍රීඩා ශූරතාව | ජපානය | - | 01 | - | 01 |
| 32 | මීටර 400 (පිරිමි) | | | 01 | 01 | - | 02 |
| 33 | මීටර 100 (කාන්තා) | | | - | 01 | - | 01 |
| 34 | මීටර 3000 බාධක දිවීම (කාන්තා) | | | 01 | - | - | 01 |
| 35 | මීටර 800 (කාන්තා) | | | - | 01 | - | 01 |
| 36 | මීටර 200 (කාන්තා) | | | - | 01 | - | 01 |
| 37 | මීටර 400 x 4 (කාන්තා) | | | - | - | 01 | 01 |
| 38 | මීටර 400 x 4(පිරිමි) | | | 01 | - | - | 01 |
| 39 | මීටර 100 (පිරිමි) | මැලේසියානු විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | මැලේසියාව | 01 | - | - | 01 |
| 40 | මීටර 100 (කාන්තා) | | | - | 01 | - | 01 |
| 41 | මීටර 400 (පිරිමි) | | | 01 | - | - | 01 |
| 42 | මීටර 400 කඩුලු | | | 01 | - | - | 01 |
| | එකතුව | | | 23 | 16 | 22 | 61 |
| 43 | කැරම් (පිරිමි) | ජාත්‍යන්තර කැරම් ශූරතාවලිය | කොරියාව | ශූරතාව | | | |
| 44 | කැරම් (කාන්තා) | | | අනු ශූරතාව | | | |
| 45 | දැල්පන්දු | ආසියානු දැල්පන්දු ශූරතාවලිය | සිංගප්පූරු | ශූරතාව | | | |











ජාත්‍යන්තර තරග ජයග්‍රහණ ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන්

## 1.3. ක්‍රීඩා ශක්ති වැඩසටහන - 2018

2018 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රු.මි. 122.00
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය - රු.මි. 103.80

ක්‍රීඩා ශක්ති වැඩසටහන නව මුහුණුවරකින් ආරම්භ කර ඇති අතර ඒ තුළින් දීප ව්‍යාප්තව විසිරී සිටින ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් හෙබි ක්‍රීඩක /ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන්ගේ ක්‍රීඩා දක්ෂතා දියුණු කිරීම මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේ මූලික පරමාර්ථය වේ.

ක්‍රීඩා ශක්ති දිස්ත්‍රික් සංචිත වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයන් 25 තුළ සංචිත 52 හි පුහුණුකරුවන් 510 යටතේ ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 9068 ක් පුහුණුවීම් කටයුතුවල නිරත වේ. පුහුණුවීම් කටයුතුවල නිරතවන ක්‍රීඩක/ක්‍රීඩිකාවන් හට මසකට පැය 24 ක පුහුණු කාලයක් සඳහා රු.1440.00 ක දීමනාවක් ද පුහුණුකරුවන් සඳහා මසකට රු. 4800.00ක දීමනාවක් ද ගෙවනු ලැබේ.

මේ වන විට 2018 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මස පෝෂණ දීමනා වෙනුවෙන් රු. 10,735,320.00 ක මුදලක් වැය වී ඇති අතර පුහුණුකරු දීමනා වෙනුවෙන් රු. 2,260,800.00 ක මුදලක් ලබා දී ඇත. ක්‍රීඩා ශක්ති වැඩසටහන වෙනුවෙන් මුද්දර ගාස්තු ලෙස එක් වර්ෂයක් සඳහා එක් දිස්ත්‍රික්කයකට රු 10,000.00 බැගින් දිස්ත්‍රික් 25 සඳහා රු 250,000.00 ක මුදලක් යොදවා ඇත.

ක්‍රීඩා ශක්ති අන්තර් දිස්ත්‍රික් තරගාවලිය පැසිපන්දු, පාපන්දු, වොලිබෝල්, නෙට්බෝල්, කබඩි යන ක්‍රීඩාවන් සඳහා 2018 වර්ෂයේ මාර්තු, අප්‍රේල් මාසයන් හි දී පැවැත් වූ අතර එම තරග සඳහා සහභාගී වූ ක්‍රීඩක/ ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් සඳහා ආහාරපාන, ගමන් වියදම්, නවාතැන් පහසුකම්, ප්‍රවාහන පහසුකම් සැපයීම හා ක්‍රීඩාංගන වෙන්කරවා ගැනීම සඳහා රු 12,210,591.25 මුදලක් වැය වී ඇත. මීට අමතරව 2017 අතැති බිල්පත් සඳහා රු 14,827,680.00 මුදලක් යොදවා ඇත.




ක්‍රීඩා ශක්ති පුහුණු වැඩසටහන්වල අවස්ථාවන්

## 1.4. ජාතික ක්‍රීඩා සංගම්

2018 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රු.මි. 108.00
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය - රු.මි. 107.92

ජාතික ක්‍රීඩා සම්මේලනයට අනුබද්ධිත ක්‍රීඩා සංගම්වල කාර්යක්ෂම පරිපාලනයක් ඇති කිරීම සඳහා ක්‍රීඩික ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා හඳුනාගෙන ඔවුන් ඉදිරියට රැගෙන යාම, ජාතික ක්‍රීඩා සංචිත පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා අධීක්ෂණය කිරීම, ජාතික ක්‍රීඩා පුහුණු වැඩසටහන් අධීක්ෂණය, කළමනාකරණය ක්‍රීඩා සංගම්වල පරිපාලනය විධිමත් කිරීමට ගෙන ඇති පියවර අතර වේ.

## 1.4.1. 2018.12.31 දින වන විට ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගම් පිළිබඳ තොරතුරු

| අංක | සංගමයේ නම | අංක | සංගමයේ නම | අංක | සංගමයේ නම |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා දුනු ශිල්ප සංගමය | 02 | ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය | 03 | ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය |
| 04 | ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සම්මේලනය | 05 | ශ්‍රී ලංකා මේස පන්දු සම්මේලනය | 06 | ශ්‍රී ලංකා වෙඩි තැබීමේ සංගමය |
| 07 | ශ්‍රී ලංකා හොකී සංගමය | 08 | ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය | 09 | ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය |
| 10 | ශ්‍රී ලංකා ආබාධිතයන්ගේ ක්‍රීඩා පිළිබඳ ජාතික සම්මේලනය | 11 | ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය | 12 | ශ්‍රී ලංකා යතුරු පැදි සංගමය |
| 13 | ශ්‍රී ලංකා ටෙනිස් සංගමය | 14 | ශ්‍රී ලංකා රෝල් බෝල් සංගමය | 15 | ශ්‍රී ලංකා සැම්බෝ සංගමය |
| 16 | ශ්‍රී ලංකා රග්බි සංගමය | 17 | ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමය | 18 | ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය |
| 19 | ශ්‍රී ලංකා කුඩෝ සංගමය | 20 | ශ්‍රී ලංකා බොක්ෂිං සම්මේලනය | 21 | ශ්‍රී ලංකා වුෂු සම්මේලනය |
| 22 | ශ්‍රී ලංකා කැරම් සම්මේලනය | 23 | ශ්‍රී ලංකා ජාතික රයිෆල් සම්මේලනය | 24 | ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය |
| 25 | ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය | 26 | ශ්‍රී ලංකා බිලියඩ් හා ස්නූකර් සම්මේලනය | 27 | ශ්‍රී ලංකා ක්‍රිකට් සම්මේලනය |
| 28 | ශ්‍රී ලංකා ජූඩෝ සම්මේලනය | 29 | ශ්‍රී ලංකා කබඩි සම්මේලනය | 30 | ශ්‍රී ලංකා චෙස් සම්මේලනය |
| 31 | ශ්‍රී ලංකා කායවර්ධන සම්මේලනය | 32 | ශ්‍රී ලංකා පාපන්දු සංගමය | 33 | ශ්‍රී ලංකා අත් පන්දු සම්මේලනය |
| 34 | ශ්‍රී ලංකා ත්‍රෝ බෝල් සංගමය | 35 | ශ්‍රී ලංකා බ්‍රිජ් සංගමය | 36 | ශ්‍රී ලංකා ජාතික ජිම්නාස්ටික් සංගමය |
| 37 | ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය | 38 | ශ්‍රී ලංකා මල්ලව පොර සංගමය | 39 | ශ්‍රී ලංකා වොලිබෝල් සංගමය |
| 40 | ශ්‍රී ලංකා තයිකොන්ඩෝ සම්මේලනය | 41 | ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනය | 42 | ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සම්මේලනය |
| 43 | ශ්‍රී ලංකා කෝ කෝ සංගමය | 44 | ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය | 45 | ශ්‍රී ලංකා සූමෝ සම්මේලනය |
| 46 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | 47 | ශ්‍රී ලංකා පා පැදි සම්මේලනය | 48 | ශ්‍රී ලංකා බෝල්රූම් නැටුම් සම්මේලනය |
| 49 | ශ්‍රී ලංකා ජූ ජිත්සු සංගමය | 50 | ශ්‍රී ලංකා සෙපටට්‍රිකෝ සංගමය | 51 | ශ්‍රී ලංකා අංගම්පොර සංගමය |
| 52 | ශ්‍රී ලංකා මොඩර්න් පෙන්ටැත්ලෝන් සංගමය | 53 | ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමය | 54 | ශ්‍රී ලංකා ඔරු පැදීමේ සංගමය |
| 55 | ශ්‍රී ලංකා බේස්බෝල් සංගමය | 56 | ශ්‍රී ලංකා සාම්ප්‍රදායික කරාතේ සංගමය | 57 | ශ්‍රී ලංකා කඩු හරඹ සංගමය |

| අංක | සංගමයේ නම | අංක | සංගමයේ නම | අංක | සංගමයේ නම |
|---|---|---|---|---|---|
| 58 | ශ්‍රී ලංකා රෝද සපත්තු සංගමය | 59 | ශ්‍රී ලංකා කඳු නැගීමේ සංගමය | 60 | ශ්‍රී ලංකා කැනොයින් සහ කායකින් සංගමය |
| 61 | ශ්‍රී ලංකා යුනිෆයිට් සම්මේලනය | 62 | ශ්‍රී ලංකා දැල් පන්දු සංගමය | | |

## 1.4.2. ජාතික ක්‍රීඩා සංගම් සඳහා ප්‍රතිපාදන ලබා දීම

| අංකය | සම්මේලනය/ සංගමය | ලබා දුන් මුදල් ප්‍රමාණය (රු) | අංකය | සම්මේලනය/ සංගමය | ලබා දුන් මුදල් ප්‍රමාණය (රු) |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | 2,930,424.60 | 02 | ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය | 83,851.00 |
| 03 | ජාතික ඔලිම්පික් කමිටුව | 2,027,966.00 | 04 | ශ්‍රී ලංකා සවි එසවීමේ සංගමය | 443,291.22 |
| 05 | ශ්‍රී ලංකා බොක්ෂිං සංගමය | 1,271,800.00 | 06 | ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය | 1,864,925.00 |
| 07 | ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමය | 2,000,000.00 | 08 | ශ්‍රී ලංකා රෝල් බෝල් සංගමය | 200,000.00 |
| 09 | ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය | 25,337,070.47 | 10 | ශ්‍රී ලංකා දැල්පන්දු සංගමය | 3,637,264.00 |
| 11 | ශ්‍රී ලංකා කැරම් සංගමය | 1,569,272.25 | 12 | ශ්‍රී ලංකා ස්කොෂ් සංගමය | 710,094.75 |
| 13 | ශ්‍රී ලංකා බිලියඩ් හා ස්නූකර් සංගමය | 413,031.00 | 14 | ශ්‍රී ලංකා වොලිබෝල් සංගමය | 14,540,661.00 |
| 15 | ශ්‍රී ලංකා ජූඩෝ සංගමය | 4,167,371.25 | 16 | ශ්‍රී ලංකා මේස පන්දු සංගමය | 3,695,101.28 |
| 17 | ශ්‍රී ලංකා පැසිපන්දු සංගමය | 1,957,845.00 | 18 | ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය | 890,000.00 |
| 19 | ශ්‍රී ලංකා යතුරුපැදි සංගමය | 988,316.32 | 20 | ශ්‍රී ලංකා ආබාධිතයන්ගේ ක්‍රීඩා සංගමය | 626,509.79 |
| 21 | ශ්‍රී ලංකා රග්බි සංගමය | 10,710,948.12 | 22 | ශ්‍රී ලංකා ස්ක්‍රැබල් සංගමය | 500,000.00 |
| 23 | ශ්‍රී ලංකා වූෂු සංගමය | 6,801,155.00 | 24 | ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමය | 761,656.20 |
| 25 | ශ්‍රී ලංකා සම්ප්‍රදායික කරාතේ සංගමය | 3,289,427.00 | 26 | ශ්‍රී ලංකා වෙඩි තැබීමේ සංගමය | 2,294,318.57 |
| 27 | ශ්‍රී ලංකා රෝද සපත්තු සංගමය | 117,750.00 | 28 | ශ්‍රී ලංකා මුයිතායි සංගමය | 321,850.00 |
| 29 | ශ්‍රී ලංකා කබඩි සංගමය | 1,301,000.00 | 30 | ශ්‍රී ලංකා ජීජුට්සු සංගමය | 100,000.00 |
| 31 | ශ්‍රී ලංකා සැම්බෝ සංගමය | 46,668.00 | 32 | ශ්‍රී ලංකා හොකී සංගමය | 3,390,708.45 |
| 33 | ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය | 100,000.00 | 34 | ශ්‍රී ලංකා සුමෝ සංගමය | 50,000.00 |

## 1.5. මානව සම්පත් කළමනාකරණය

### 1.5.1. පුහුණු පාඨමාලා සමාලෝචනය


කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය සඳහා රු.මි. 6.5 ක් වෙන් වී ඇති අතර රු.මි. 1.93 ක වැය දැරීමක් සිදු කර ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් 38 දෙනෙකු වැඩ මුළු 10 ක් සඳහා ද, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නොවන නිලධාරීන් 33 දෙනෙකු වැඩ මුළු 16 ක් සඳහා ද, නිලධාරීන් තිදෙනෙකු විදේශීය පුහුණු පාඨමාලා 2 ක් සඳහා ද යොමු කර ඇත.

### 1.5.2. කාර්ය මණ්ඩල විස්තර 2018.12.31

| අංකය | තනතුර | වැටුප්තලය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | සිටින | පුරප්පාඩු |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ප.1 විශේෂ) | SL 1 | 01 | 01 | 00 |
| 02 | අධ්‍යක්ෂ (පාලන) (ශ්‍රී.ලං.ප.1) | SL 1 | 01 | 00 | 01 |
| 03 | අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ලං.ක්‍ර.1) | SL 1 | 01 | 01 | 00 |
| 04 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) (ශ්‍රී.ලං.ඉ.1) | SL 1 | 01 | **00** | 01 |
| 05 | ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග. 1) | SL 1 | 01 | 01 | 00 |
| 06 | අභ්‍යන්තර විගණක | SL 1 | 01 | 01 | 00 |
| 07 | අධ්‍යක්ෂ (ක්‍රීඩා) (දෙපා. 1) | SL 1 | 01 | 00 | 01 |
| 08 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පාලන) (ශ්‍රී.ලං.ප.11/111) | SL 1 | 01 | 01 | 00 |
| 09 | ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග. 11/111) | SL 1 | 02 | 01 | 01 |
| 10 | ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.11/111) | SL 1 | 01 | 01 | **00** |
| 11 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) (දෙපා. 11/111) | SL 1 | 04 | 04 | **00** |
| 12 | පරිපාලන නිලධාරී (කළමනාකරණ සහකාර අධි පන්තිය) | MN 7 | 01 | 01 | 00 |
| 13 | මූලස්ථාන ක්‍රීඩා නිලධාරි | MN 7 | 20 | 11 | 09 |
| 14 | භාෂා පරිවර්තක | MN 6 | 01 | 01 | 00 |
| 15 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | MN 6 | 01 | 00 | 01 |
| 16 | සංවර්ධන නිලධාරි (දෙපාර්තමේන්තුගත) | MN 4 | 04 | 00 | 04 |

| අංකය | තනතුර | වැටුප්තලය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | සිටින | පුරප්පාඩු |
| **17** | මානව සම්පත් සංවර්ධන සහකාර (දෙපාර්තමේන්තුගත) | MN 4 | 01 | 00 | 01 |
| **18** | සංවර්ධන නිලධාරි (නව) | MN 4 | 55 | 31 | 24 |
| **19** | සැලසුම් හා වැඩ සටහන් සහකාර (දෙපාර්තමේන්තුගත) | MN 4 | 02 | **00** | 02 |
| **20** | ක්‍රීඩාංගන භාර නිලධාරී | MN 4 | 03 | 00 | 03 |
| **21** | ක්‍රීඩා පුහුණුකරු | MN 3 | 103 | 83 | 20 |
| **22** | ක්‍රීඩා නිලධාරි | MN 3 | 40 | 38 | 02 |
| 23 | තාක්ෂණ නිලධාරි | MN 3 | 02 | 02 | 00 |
| **24** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | MT 1 | 01 | 01 | 00 |
| **25** | කළමනාකරණ සහකාර (පංතිය 1/11/111) | MN 2 | 23 | 21 | 02 |
| **26** | නිවාස පාලක | MN 1 | 02 | 01 | 01 |
| **27** | සහකාර නිවාස පාලක | MN 1 | 01 | 01 | 00 |
| **28** | ව්‍යායාම සහකාර | MN 1 | 06 | 00 | 06 |
| **29** | ක්‍රීඩා භූමි ලිපිකරු | MN 1 | 06 | 00 | 06 |
| **30** | රියදුරු සේවය (පංතිය 1,11අ/11 ආ) | PL 3 | 14 | **09** | 05 |
| **31** | රියදුරු සේවය (පංතිය 1,11/111 විශේෂ) | PL 3 | **03** | **00** | **03** |
| **32** | අරක්කැමි | PL 2 | 01 | **00** | **01** |
| **33** | සහකාර අරක්කැමි | PL 1 | 02 | 02 | 00 |
| **34** | කා.සේ. සේ (1/11/111) | PL 1 | 17 | 14 | 03 |
| **35** | ක්‍රීඩා භූමි සහායක | PL 1 | 64 | 58 | **06** |
| **36** | ජීවිතාරක්ෂක නිලධාරි | PL 1 | 03 | 00 | 03 |
| එකතුව | | | **391** | **285** | **106** |

## 1.5.3. සංවිධාන ව්‍යුහය




3

## 2. යටිතල පහසුකම් සංවර්ධනය

### 2.1. පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම

| | | |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | - රු.මි. | 1000.00 |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය | - රු.මි. | 678.75 |
| 2018 දෙසැම්බර් 31 දිනට අතැති බිල් | - රු.මි. | 179.42 |
| 2018 දෙසැම්බර් 31 දිනට සමස්ථ ප්‍රගතිය | - රු.මි. | 858.17 |

නාගරික ප්‍රදේශවලට පමණක් සීමා වී පැවති ක්‍රීඩා යටිතල පහසුකම් ගමට ගෙනයාම තුළින් ජාත්‍යන්තරය ජයගත හැකි ග්‍රාමීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමේ අරමුණින් සියලු පහසුකම්වලින් යුත් පළාත් ක්‍රීඩා සංකීර්ණ 09 ක් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 16 ක් සමස්ථ දිවයින ම ආවරණය වන පරිදි ඉදි කෙරෙමින් පවතී.

එම පළාත් ක්‍රීඩා සංකීර්ණයන් මීටර් 400 ධාවන පථයක්, පුහුණු ධාවන පථයක්, ක්‍රිකට් ක්‍රීඩාංගනයක් සහ අනෙකුත් ක්‍රීඩා පහසුකම් ඇති ක්‍රීඩාපිටියක්, ප්‍රේක්ෂකාගාරයක්, මීටර් 50 පිහිනුම් තටාකාංගනයක්, ගෘහස්ථ ක්‍රීඩාගාරයක්, ක්‍රීඩා වෛද්‍ය ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පහසුකම්, ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පුහුණු පාඨමාලා පැවැත්වීමට හැකි පුහුණු පහසුකම්, ආපන ශාලාවක් හා භෝජනාගාරයක් සහිතව ඉදි කෙරේ. මීට අමතරව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ මීටර් 25 පිහිනුම් තටාකාංගනය, මීටර් 400 ධාවන පථය, ගෘහස්ථ ක්‍රීඩාංගනය හා ප්‍රේක්ෂකාගාරය යන පහසුකම්වලින් සමන්විතව ඉදි කරනු ලැබේ.

#### 2.1.1. 2018 දෙසැම්බර් 31 වන විට ජනතා අයිතියට පත් කර ඇති පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයන්

| අංකය | පළාත/ දිස්ත්‍රික්කය | ක්‍රීඩා සංකීර්ණයේ නම | ව්‍යාපෘතියේ වටිනාකම (රු.මි) | ජනතා අයිතියට පවරා ඇති දිනය |
|---|---|---|---|---|
| පළාත් ක්‍රීඩා සංකීර්ණ | | | | |
| 01 | උතුරු මැද පළාත | අනුරාධපුර පළාත් ක්‍රීඩා සංකීර්ණය | 317.61 | 2014.05.08 |
| 02 | ඌව පළාත | බදුල්ල වින්සන්ට් ඩයස් ක්‍රීඩා සංකීර්ණය | 411.70 | 2014.12.05 |
| 03 | මධ්‍යම පළාත | මහනුවර දිගන පළාත් ක්‍රීඩා සංකීර්ණය | 510.00 | 2017.03.01 |
| 04 | නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය මැකේෂර් ක්‍රීඩා සංකීර්ණය | 392.52 | 2017.03.17 (නීතිමය ගැටළු පවතින බැවින් ධාවන පථය හැර ඉතිරි අංගයන් ජනතා අයිතියට පවරා ඇත.) |
| | එකතුව | | 1631.83 | |

| අංකය | පළාත/ දිස්ත්‍රික්කය | ක්‍රීඩා සංකීර්ණයේ නම | ව්‍යාපෘතියේ වටිනාකම (රු.මි) | ජනතා අයිතියට පවරා ඇති දිනය |
|---|---|---|---|---|
| දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ | | | | |
| 05 | යාපනය දිස්ත්‍රික්කය | යාපනය දොරෙයිඅප්පා ක්‍රීඩා සංකීර්ණය | ඉන්දියානු රජයේ ආධාර මත ඉදි කෙරිණි | 2016.06.18 |
| 06 | මාතර දිස්ත්‍රික්කය | මාතර (කොටවිල) දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 314.16 | 2016.07.04 |
| 07 | මඩකලපුව දිස්ත්‍රික්කය | මඩකලපුව වෙබර් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 251.79 | 2016.07.06 |
| 08 | පොළොන්නරුව දිස්ත්‍රික්කය | පොළොන්නරුව (ගල්ලැල්ල) දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 418.54 | 2016.08.25 |
| 09 | කළුතර දිස්ත්‍රික්කය | කළුතර (බණ්ඩාරගම) දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 247.85 | 2017.06.29 |
| 10 | කෑගල්ල දිස්ත්‍රික්කය | කෑගල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 307.56 | 2018.11.12 |
| | එකතුව | | 1539.90 | |

## 2.1.2. 2019 වසර තුළ ජනතා අයිතියට පත් කිරීමට නියමිත දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා සංකීර්ණ

| අංකය | ක්‍රීඩා සංකීර්ණයේ නම | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල (රු.මි.) | 2018.12.31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය | 2018 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01 | සබරගමුව පළාත් ක්‍රීඩා සංකීර්ණය (ගෘහස්ථ ක්‍රීඩාගාරය හා පිහිණුම් තටාකය පමණි) | 514.69 | 359.43 | 76% | 102.35 | 87.78 |
| 02 | පුත්තලම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 364.32 | 304.31 | 98% | 51.51 | 39.39 |
| 03 | අම්පාර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 308.56 | 229.12 | 98% | 37.00 | 9.06 |
| | එකතුව | 1187.57 | 892.86 | | 190.86 | 136.23 |



සබරගමුව පළාත් ක්‍රීඩා සංකීර්ණය



පුත්තලම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය

## 2.1.3. ඉදිකිරීම් ආරම්භ කර ඇති පළාත් ක්‍රීඩා සංකීර්ණයන් හි ප්‍රගතිය

| අංකය | ක්‍රීඩා සංකීර්ණයේ නම | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල (රු.මි.) | 2018.12.31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය | 2018 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01 | කිලිනොච්චිය පළාත් ක්‍රීඩා සංකීර්ණය | 332.92 | 320.02 | 85% | 83.00 | 19.92 |
| 02 | බිංගිරිය පළාත් ක්‍රීඩා සංකීර්ණය | 433.88 | 162.30 | 80% | 124.02 | 84.07 |
| | එකතුව | 766.80 | 482.32 | | 207.02 | 103.99 |



කිලිනොච්චිය පළාත් ක්‍රීඩා සංකීර්ණය



බිංගිරිය පළාත් ක්‍රීඩා සංකීර්ණය

### 2.1.4 ඉදිකෙරෙමින් පවතින දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයන් හි ප්‍රගතිය

| අංකය | ක්‍රීඩා සංකීර්ණයේ නම | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල (රු.මි.) | 2018.12.31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය | 2018 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01 | මන්නාරම් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 258.43 | 89.23 | 35% | 62.84 | 16.96 |
| 02 | ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 283.22 | 234.68 | 80% | 66.28 | 60.64 |
| 03 | මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 262.84 | 247.13 | 80% | 68.47 | 65.15 |
| 04 | වව්නියා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 257.50 | 225.50 | 80% | 54.51 | 49.28 |
| 05 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 257.53 | 126.93 | 45% | 37.13 | 29.75 |
| | එකතුව | 1319.52 | 923.47 | | 289.23 | 221.78 |

## 2.2. යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය

**2018 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රු.මි. 531.70**
**2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය - රු.මි. 237.29**
**2018 දෙසැම්බර් 31 දිනට අතැති බිල් - රු.මි. 53.67**
**2018 දෙසැම්බර් 31 දිනට සමස්ථ ප්‍රගතිය - රු.මි. 290.96**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සෑම පුරවැසියෙකුටම ක්‍රීඩාවන්ට යොමුවීම සඳහා සමාන අවස්ථා ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දරන අතර, අවම භෞතික පහසුකම් පවා නොමැති ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රීඩා පහසුකම් නංවාලීම පිණිස ප්‍රමුඛතාව දෙමින් කටයුතු කරනු ලබයි.

ඒ අනුව කුරුණෑගල, කොළඹ, කෑගල්ල, මාතලේ, මහනුවර, අම්පාර, මොණරාගල, ගම්පහ, මන්නාරම, නුවරඑළිය, කළුතර, රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන ලෙස ග්‍රාමීය, පාසල් ක්‍රීඩාපිටි සහ පිහිනුම් තටාක 53 ක ඉදි කිරීම් කටයුතු සිදු වෙමින් පවතී.



ඉදිවෙමින් පවතින නාරම්මල මයුරපාද විද්‍යාලීය ප්‍රේක්ෂකාගාරය



ඉදිවෙමින් පවතින ඩී.එස්.සේනානායක විද්‍යාලීය ක්‍රිකට් පිටිය

## 2.3. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති ඒකකයන්

ටොරින්ටන් හි පිහිටා ඇති පහත සඳහන් ඒකකයන් මඟින් ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන් ම ක්‍රීඩාවට සම්බන්ධ සියලුම පාර්ශවයන් සඳහා සේවාවන් ලබා දේ.

1. ගෘහස්ථ ක්‍රීඩාගාරය
2. නේවාසිකාගාරය
3. ශක්ති වර්ධන ශාලාව
4. ටොරින්ටන් ක්‍රීඩාංගනය
5. හොකී පිටිය





## 2.4. ජාතික ක්‍රීඩා කෞතුකාගාරය

ක්‍රීඩාවේ ඓතිහාසික වැදගත්කම අනාගත පරපුරට උරුමකර දීමත්, ක්‍රීඩාව හා බැදි සිහිවටනයන් සංරක්ෂණය කර තබා ගැනීමත් උදෙසා ජාතික ක්‍රීඩා කෞතුකාගාරය ඉදි කරමින් පවතී.

ක්‍රීඩාවේ ඉතිහාසය පිළිබඳ අනාගත පරපුර දැනුවත් කිරීම, ක්‍රීඩා විෂය හා අනුබද්ධ ලිපිලේඛන සහ ශ්‍රේෂ්ඨ ක්‍රීඩක ශූරතා සිහිවටන සංරක්ෂණය, ජාත්‍යන්තර ජයග්‍රහණ ලබාගත් ක්‍රීඩකයන්ගේ ජීවමාන ප්‍රමාණයේ පිළිරූ මැදිරියක් ඉදිකිරීම, ජාතික ක්‍රීඩා සංගම්වල ඉතිහාසය ඇතුළත් කිරිම සහ ක්‍රීඩා තොරතුරු ලබාගැනීමේ තොරතුරු මධ්‍යස්ථානයක් ඇති කිරීම මෙහි අරමුණු වේ.

මෙම ව්‍යාපාතිය සඳහා **2016** සිට මෙම වසර දක්වා මුළු ප්‍රතිපාදන වෙන් කිරීම රුපියල් මිලියන **80.00** ක් වන අතර ඉන් රුපියල් මිලියන **63.42** ක මේ වන විට වැයක් දරා ඇත. **2018** වර්ෂය වෙනුවෙන් වෙන් වූ රුපියල් මිලියන **10.00** න් රුපියල් මිලියන **4.83** ක් මෙම වර්ෂය සඳහා වැය කර ඇත.




## 3. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය

| අනු අංකය | වැය ශීර්ෂය | විස්තරය | 2018 ප්‍රතිපාදන (රු.මිලි) | 2018.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.) | | අතැති බිල්පත් වටිනාකම (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (අතැති බිල්පත් ද සමඟ) (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ක්‍රී.සං.දෙ | දි.ලේ | | | |
| 1 | 2506 | යටිතල පහසුකම් සංවර්ධනය | 531.70 | 237.29 | 58.75 | 56.43 | 55% | 70% |
| 2 | 17 – 2104 | දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම. | 1000.00 | 678.75 | 6.03 | 179.42 | 86% | 80% |
| 3 | 21 – 2104 | ජාතික ක්‍රීඩා කෞතුකාගාරය ඉදිකිරීම | 10.00 | 4.83 | | 0.00 | 48% | 85% |
| 4 | 2 – 1409 | දක්ෂතා සංවර්ධනය | 600.00 | 562.64 | 33.24 | 23.93 | 100% | 100% |
| | | i. ක්‍රීඩා ශක්ති | 122.00 | 103.80 | | 7.14 | 90% | 85% |
| | | ii. ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලි | 184.00 | 169.96 | 33.24 | 0.066 | 92% | 92% |
| | | iii. ජාතික ක්‍රීඩා සංගම් | 108.00 | 107.92 | | 13.42 | 99% | 100% |
| | | iv. ජාතික මහා ක්‍රීඩා උළෙල | 186.00 | 180.96 | | 3.31 | 100% | 87% |

## 4. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

**වියදම් ශීර්ෂ අංකය : 219**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

රුපියල්

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් (1) | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් (2) | මු.රෙ. 66/69 මාරු කිරීම් (3) | මුළු ශුද්ධ වෙන්කිරීම් (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 62,850,000 | - | - | 62,850,000 | 57,771,180 | 5,078,820 |
| | (2) ප්‍රාග්ධන | 5,600,000 | - | - | 5,600,000 | 3,749,465 | 1,850,535 |
| | උප එකතුව | **68,450,000** | **-** | **-** | **68,450,000** | **61,520,645** | **6,929,355** |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | 1,031,600,000 | 50,000,000 | (16,000,000)<br>16,000,000 | 1,081,600,000 | 914,524,324 | 167,075,676 |
| | (2) ප්‍රාග්ධන | 1,848,000,000 | 405,700,000 | - | 2,253,700,000 | 1,080,549,316 | 1,173,150,684 |
| | උප එකතුව | **2,879,600,000** | **455,700,000** | - | **3,335,300,000** | **1,995,073,640** | **1,340,226,360** |
| | | | | - | | | |
| | මුළු එකතුව | **2,948,050,000** | **455,700,000** | - | **3,403,750,000** | **2,056,594,285** | **1,347,155,715** |
| | | | | | | | |





# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

## விளையாட்டு அபிவிருத்தித் திணைக்களம்

## Department of Sports Development

**අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.**
இல. 9, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07, இலங்கை.
**No. 9, Philip Gunawardena Mawatha, Colombo 07, Sri Lanka.**

Design by : 0702 421 435
PRINTEC | 0112 815 816